සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

2025-01-

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Learning Resource Center R De Mazenod College Kandana 54575

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| ශ්‍රේණිය / தரம் / Grade | 06 | විෂයය / பாடம் / Subject | ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper | I/II | කාලය / காலம் / Time | පැය 2 |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..........................

සැලකිය යුතුයි.

- I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසිවල ලියන්න.

## I කොටස

- අංක 01 සිට 20 දක්වා සියලුම ප්‍රශ්නවලට වඩාත් සිදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසේ දී මහානාම හිමි විසින් රචනා කරන ලදැයි සැලකෙන සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ මින් කුමක් ද?
(1) දීපවංසය (2) මහාවංසය (3) බෝධිවංසය (4) ථූපවංසය

02. ඔපබීනියා ලෙස නම්කර ඇති ඉතාම පැරණි සතෙකුගේ පාෂාණීභූත සළකුණක් සොයාගනු ලැබුවේ,
(1) කැනඩාවෙන් ය. (2) ඊශ්‍රායලයෙන් ය. (3) චීනයෙන් ය. (4) මෙක්සිකෝවෙන් ය.

03. මිනිසෙකු වීමට නැඹුරුවක් ඇතිකළ පැරණිතම වානරයා හැඳින්වෙන්නේ කුමන නමින් ද?
(1) ඔස්ට්‍රලෝපිතිකස් (2) හෝමෝ හැබිලස්
(3) හෝමෝ ඉරෙක්ටස් (4) හෝමෝ නියැන්ඩතාලෙන්සිස්

04. අප සියලු දෙනාම අයත් වන්නේ මින් කුමන මානව වර්ගයට ද?
(1) හෝමෝ ඉරෙක්ටස් (2) හෝමෝ හැබිලස්
(3) හෝමෝ සාපියන් (4) ඔස්ට්‍රලෝපිතිකස්

05. ඇට සැකිළි මත වර්ණාලේප කිරීම සඳහා අපේ පැරණි ජනතාව භාවිත කරන ලද ගල් වර්ගය වන්නේ,
(1) හුණුගල් ය. (2) කබොක් ගල් ය. (3) ගුරුගල් ය. (4) කළුගල් ය.

06. මහා හිම යුගය ආරම්භවීමත් සමග ඇති වූ ප්‍රබල වෙනසක්කමක් වූයේ,
(1) මිනිසා විසින් පළමුවරට ගින්දර භාවිතය යි.
(2) දඩයම් කිරීම වෙනුවට කොළ, ගෙඩි, අල වර්ග ආහාරයට ගැනීම යි.
(3) දූප්පත් පොහොසත් යන බෙදීම ඇතිවීම යි.
(4) චිම්පන්සි වර්ගයක් පාද දෙකෙන් ඇවිද යාමට හුරුවීම යි.

07. හෝමෝ සාපියන් මානවයා විසින් සාදන ලද පැරණි බටනලාව තනා ඇත්තේ කුමන ද්‍රව්‍යයකින් ද?
(1) ලී (2) අස්ථි (3) ලෝහ (4) මැටි

08. වෘත්තයකට අංශක 360ක් ඇති බව මුල්වරට ප්‍රකාශ කරන ලද්දේ කුමන ශිෂ්ටාචාරයක විසූ ගණිතඥයන් විසින් ද?
(1) චීන (2) ඊජිප්තු (3) ඉන්දු නිම්න (4) මෙසපොතේමියානු

09. මාලිමා යන්ත්‍රය මුලින්ම ලෝකයට හඳුන්වා දෙනු ලැබූ ශිෂ්ටාචාරය ලෙස ගෞරවාදරයට පත් වන්නේ, මින් කුමන ශිෂ්ටාචාරය ද?
(1) ඊජිප්තු (2) මෙසපොතේමියානු (3) ඉන්දු නිම්න (4) චීන

10. විවිධ රූප සංකේත ලෙස භාවිත කරමින් චිත්‍රාක්ෂර උපයෝගී කරගෙන ලිවීමේ ක්‍රමයක් පැවති බවට තොරතුරු හමුවන ශිෂ්ටාචාරය වන්නේ,
(1) මෙසපොතේමියානු (2) ඉන්දුනිම්න (3) ඊජිප්තු (4) චීන

11. මායා ශිෂ්ටාචාරයට අදාළ තොරතුරක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) පළමුවරට රබර් බෝලයක් නිපදවන ලදී.
(2) අපද්‍රව්‍ය බැහැර කිරීමට නළ පද්ධති තනන ලදී.
(3) ලෝකයේ පැරණිම අක්ෂර පද්ධතිය නිපදවන ලදී.
(4) මමීකරණ ක්‍රමය ලෝකයට හඳුන්වා දෙන ලදී.

12. මෙසපොතේමියාවේ ජීවත් වූ ගිල්ගමේෂ් නැමැත්තා ප්‍රසිද්ධියට පත්වීමට හේතු වූ සිදුවීම වන්නේ,
(1) සත්ත්ව සංකේත සහිත මැටි මුද්‍රා තැනීම නිසා ය.
(2) කූන්‍ය අක්ෂරයෙන් ලියන ලද වීර කතාව නිසා ය.
(3) නෙෆර්ටිටි රැජිනගේ උඩුකය මූර්තිය තැනීම නිසා ය.
(4) මුද්‍රණ යන්ත්‍රය නිපදවීම නිසාය

13. මහාවංසයේ සඳහන් වන පරිදි විජය කුමරු මෙරටට ගොඩබසින විට ඔහු සමග පැමිණි පිරිස කොපමණ ද?
(1) දෙසීය කි. (2) පන්සීය කි. (3) හත්සීය කි. (4) අටසීය කි.

14. නගරයක් අසල පළමු වරට වැවක් ඉදිකළ රජතුමා ලෙස ගෞරවාදරයට පත්වූයේ,
(1) පණ්ඩුකාභය රජතුමා ය. (2) දේවානම්පියතිස්ස රජතුමා ය.
(3) වසභ රජතුමා ය. (4) මහසෙන් රජතුමා ය.

15. පුරාණ කාලයේ දී දාගැබේ ආරක්ෂාවට ඉදිකළ ගොඩනැගිල්ල හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?
(1) ලහබත් ගේ (2) ගෙඩි ගේ (3) අටදාගෙය (4) වටදාගෙය

16. මහා පදුම සහ කුංජ යන ඇතුන් දෙදෙනෙකු විසින් අදින ලද නඟුලකින් අනුරාධපුරයේ නගර සීමාව ලකුණු කරවන ලද්දේ,
(1) දේවානම්පියතිස්ස රජතුමා ය. (2) දුටුගැමුණු රජතුමා ය.
(3) වළගම්බා රජතුමා ය. (4) ධාතුසේන රජතුමා ය.

17. ශ්‍රී ලංකාවේ දකුණු හා ගිනිකොන ප්‍රදේශවල පැවති රාජධානිය වූයේ,
(1) අනුරාධපුර රාජධානිය යි. (2) මාගම රාජධානිය යි.
(3) රයිගම රාජධානිය යි. (4) කෝට්ටේ රාජධානිය යි.

18. • **දකුණු ඉන්දීය ආක්‍රමණිකයින් පිරිසකට මුහුණ දීම.**
• **තිස්ස නම් බ්‍රාහ්මණයාගේ කැරැල්ලට මුහුණ දීම.**

ඉහත සඳහන් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වූ රජතුමා කවුරුන් ද?
(1) වළගම්බා රජතුමා ය. (2) වසභ රජතුමා ය.
(3) මහසෙන් රජතුමා ය. (4) ධාතුසේන රජතුමා ය.

19. වසභ රජතුමා සම්බන්ධ නිවැරදි වගන්තිය තෝරන්න.
(1) ආගමික සහජීවනය උදෙසා දේවාල ඉදිකිරීම.
(2) ශ්‍රී මහා බෝධිය මහමෙවුනා උයනේ රෝපණය කිරීම.
(3) සෝමා දේවිය වෙනුවෙන් දාගැබක් ඉදි කිරීම.
(4) උමං ජල මාතිකා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

20. ශ්‍රී ලංකාවේ ඉදිකළ විශාල ස්තූපය ලෙසත්, සමස්ත ලෝකයේ ම ඉදි වූ විශාලතම ගඩොළු ස්තූපය ලෙසත් ප්‍රසිද්ධියට පත් දාගැබ වන්නේ,
(1) ථූපාරාමය යි. (2) රුවන්වැලි මහා සෑයයි.
(3) ජේතවන දාගැබ යි. (4) අභයගිරි දාගැබ යි.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

සැළකිය යුතුයි:

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතුරින් කැමති ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

---

01. A හා B වශයෙන් දක්වා ඇති පින්තූර ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. මෙම රූපයේ දැක්වෙන්නේ කවුරුන් ද?

ii. මෙය සකස් කර තිබෙන්නේ කුමන ද්‍රව්‍යයකින් ද?

iii. මෙය අයත්වන ශිලා යුගය නම් කරන්න.

iv. මේවා තැනූ මානවයින්ට තිබුණු තවත් එක් හැකියාවක් සඳහන් කරන්න.



A



B

v. මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

vi. මෙය කුමන ශිෂ්ටාචාරයට අයත් වේ ද?

vii. මේවා තුළ තැන්පත්කර තිබෙන්නේ මොනවා ද?

viii. මේවා දක්නට ලැබෙන ලෝකයේ ප්‍රසිද්ධ ස්ථානය නම් කරන්න.

(ලකුණු 2 x 8 = 16)

02. i. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලට අයත්වන දේවල් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. ඉතිහාසයේ විවිධ සිදුවීම් අයත්වන කාලය මැන ගැනීමට භාවිත කරන වර්ෂ ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. ඉතිහාසය ඉගෙන ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

03. i. ආදි මානවයා දඩයම් කිරීමේ දී භාවිත කළ උපකරණ (මෙවලම්) දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. ගින්දර භාවිතයට හුරුවීම නිසා ආදි මානවයින් ලැබූ ජයග්‍රහණ දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. නව ශිලා යුගයේ දී මිනිසුන් ගොවිතැන ආරම්භ කිරීම නිසා ලැබූ දියුණුව විස්තර කරන්න. (ලකුණු 05)

04. i. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය ව්‍යාප්ත වී තිබුණු ගංගා නිම්න දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය ඇසුරින් පහත දැක්වෙන තොරතුරුවලට අදාල පිළිතුරු වරහන තුළින් තෝරාගෙන A, B, C, D අනුපිළිවෙළට ලියන්න.

(ඇසිරියන්, හමුරාබි, සිගුරට්, එන්ලිලි, එන්කිකි)

A - මෙසපොතේමියානු වැසියන්ගේ දේවාල හැඳින්වූ විශේෂ නම:

B - පොළොවට අධිපති දෙවියන් හැඳින් වූ නම:

C - මෙසපොතේමියානු දක්ෂ වෙළෙන්දන් හැඳින්වූ නම:

D - ලෝකයේ පැරණිතම නීතිපොත තැනූ මෙසපොතේමියානු පාලකයාගේ නම: (ලකුණු 04)

iii. මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ ගොවියෝ කෘෂිකර්මය හා සත්ත්ව පාලනය සිදුකළ ආකාරය විස්තර කරන්න.

(ලකුණු 05)

05. i. මුහුණුවල පවතින වෙනස්කම් අනුව ලෝකය පුරා ව්‍යාප්ත වී ඇති හෝමෝසාපියන්වරු අයත්වන වර්ග දෙකක් නම් කරන්න.

(ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ මුල් ජනාවාසවල විසූ ජනතාව ආහාරයට ගත් සත්ත්ව වර්ග හතරක් නම් කරන්න.

(ලකුණු 04)

iii. මහවංසයේ සඳහන් පරිදි විජය කුමරු මෙරටට ගොඩබැසීම හා ඔවුන් පිහිටුවා ගත් ගම්මාන පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

(ලකුණු 05)

06. i. දසමහා යෝධයින් අතුරින් දෙදෙනෙකුගේ නම් ලියන්න.

(ලකුණු 02)

ii. පහත සඳහන් රජවරු විසින් ඉදිකළ වැව් වරහන තුළින් තෝරාගෙන A, B, C, D අනුපිළිවෙළින් සඳහන් කරන්න.

(කලාවැව, නොච්චිපොතාන වැව, අභය වැව, හුරුළු වැව)

A - පණ්ඩුකාභය රජතුමා

B - වසභ රජතුමා

C - මහසෙන් රජතුමා

D - ධාතුසේන රජතුමා

(ලකුණු 04)

iii. පණ්ඩුකාභය රජතුමා අනුරාධගම නමින් හැඳින් වූ ප්‍රදේශය අනුරාධපුරයක් ලෙස දියුණු කිරිමට කටයුතු කළ ආකාරය විස්තර කරන්න.

(ලකුණු 05)

07. i. දුටුගැමුණු රජතුමා විසින් තැනවූ දාගැබ් දෙකක් නම් කරන්න.

(ලකුණු 02)

ii. පහත සඳහන් සිදුවීම් සිදුවූයේ කුමන රජතුමාගේ කාලයේ දී දැයි A, B, C, D අනුපිළිවෙළට සඳහන් කරන්න.

A - ශ්‍රී මහා බෝධියේ ශාඛාවක් මෙරටට වැඩම කරවීම.

B - බැමිණිතියාසාය නම් දරුණු සාගතය ඇතිවීම.

C - යාපනය ප්‍රදේශය පාලනය කිරීම සඳහා ඉසිගිරිය ඇමති පත් කිරීම.

D - යෝධ ඇළ හෙවත් ජයගඟ ඉදි කරවීම

(ලකුණු 04)

iii. මහසෙන් රජතුමා කෘෂිකර්මාන්තය හා බුදු දහම දියුණු කිරීමට ගත් ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

******